# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,949 - 2016 ජනවාරි මස 08 වැනි සිකුරාදා - 2016.01.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 292 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 3149 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 297 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජනවාරි මස 29 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජනවාරි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු – ඇබෑර්තු

## මහරගම නගර සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

මහරගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත දක්වෙන තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර හා වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| 01. වැඩ ක්ෂේත්‍ර කම්කරු<br>මාසික : රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600<br>(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 06/2006 iv හි PL1/2006 A)<br>(හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)<br><br>පුරප්පාඩු සංඛ්‍යාව : 06<br>බඳවා ගැනීමේ ක්‍රමය :<br>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 24/95 ට අනුකූලව සියලුම බඳවා ගැනීම් සිදු කෙරේ. | *(අ)* අවම වශයෙන් 08 වන ශ්‍රේණිය/ 9 වසර සමත්වී තිබිය යුතුය. |

02. *පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

(ii) අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.

(iii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

(iv) අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට වයස අවුරුදු 18 නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි .-*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) බඳවා ගනු ලබන සේවකයින් 03 අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාල සීමාවකට යටත් වේ.

(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසි වලටද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලටද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලටද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥා පනතේ/පනත්වල විධිවිධාන වලටද, මහරගම නගර සභාව විසින් වරින් වරට නිකුත් කරනු ලබන නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.

*04. ඉල්ලුම් කළ යුතු ආකාරය .-* මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2016.01.29 වැනි දිනට ප්‍රථම, ''ලේකම්, මහරගම නගර සභාව, මහරගම'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් තම ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතු ය.) නියමිත දින පසුවී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මහරගම නගර සභාවේ ලේකම් සතුය.

කේ. ටී. ගම්ලත්,
ලේකම්,
මහරගම නගර සභාව.

2015 දෙසැම්බර් මස 16 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම*
*මහරගම නගර සභාව*

.................................... *තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමඟ නම :—————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම:—————————.
03. ස්ථිර ලිපිනය:—————————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:—————————.
05. දුරකථන අංකය:—————————.
06. ජාතික හැඳුනුම්පත් අංකය:—————————.
07. උපන් දිනය අවු.:————— මාස:————— දින:—————
08. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු.:————— මාස:————— දින:—————
09. ස්ත්‍රී/පුරුෂ භාවය:—————————.
10. විවාහක/අවිවාහක බව:—————————.
11. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින්ද ලියාපදිංචියෙන්ද යන වග:—————————.
12. *අධ්‍යාපන සුදුසුකම්* (**සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.**)

(I) අ.පො.ස. (සා. පෙළ) විභාගය:
සමත් වර්ෂය හා විභාග අංකය:—————————.

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

| *අනු අංකය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|
| 6. | | |
| 7. | | |
| 8. | | |
| 9. | | |
| 10. | | |

(II) අවසන් වරට සමත් වූ ශ්‍රේණිය/වසර : ......................................

13. *වෙනත් සුදුසුකම්* : ..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

14. *සේවා පළපුරුද්ද* :

13.1 දැනට සේවය කරන ආයතනය:.....................
13.2 දැනට දරන තනතුර :.....................
13.3 එම තනතුරට පත් වූ දිනය :.....................
13.4 මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :.....................

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව දනිමි.

....................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...................................

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන....................... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ....................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

....................................
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :................................
පදවි නාමය හා ආයතනය :................................

01-324

# පළාත් පාලන නිවේදන

## බදුල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) (අ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) (අ) වැනි වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල ප්‍රාදේශීය සභාව විසින් අංක 1792 හා 2013.01.04 දිනැති *ගැසට් පත්‍රයේ* පල කර ඇති මංමාවත් සඳහා මෙම කාල සීමාව තුළ කිසිදු විරුද්ධත්වයක් ඉදිරිපත් වී නොමැති හෙයින් එම මංමාවත් බදුල්ල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බවට *ගැසට් පත්‍රයේ* පළ කරන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එච්. වයි. කෝ,
සභා ලේකම්,
බදුල්ල ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් 10 වන දින,
බදුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

01-315

---

## කෝරළේපත්තු බටහිර ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් පහත සඳහන් කොට්ඨාසවල වරිපනම් බදු අයකර ගැනීම සඳහා එම ප්‍රදේශ සංවර්ධනය වූ ප්‍රදේශ ලෙස ප්‍රකාශ කිරීම

කෝරළේපත්තු බටහිර ප්‍රාදේශීය සභාව මගින් 2015.05.11 වැනි දින සභාවේ තීරණ අංක 08 යටතේ පහත සඳහන් යෝජනාවක් ස්ථිර කර ගත්බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ. තවද 2015.10.05 වැනි දින සැලසුම් උපදෙස් කමිටු රැස්වීමේ දී ගනු ලැබූ අංක 04 තීරණය අනුව පහත සඳහන් කෝරළේපත්තු බටහිර සභාවේ බලප්‍රදේශයට අයත් ඕට්ටමාවඩි - 01 උතුර, ඕට්ටමාවඩි - 01 දකුණ, ඕට්ටමාවඩි - 02, ඕට්ටමාවඩි - 03, මීරාවෝඩේ බටහිර, මීරාවෝඩේ නැගෙනහිර යන කොට්ඨාසවලට අයත්

1. ඕට්ටමාවඩි - 01 ට අයත් 208B/2 යන ඕට්ටමාවඩි - 01 උතුරු ග්‍රාම සේවා නිළධාරි කොට්ඨාසය ද,
2. ඕට්ටමාවඩි - 01 ට අයත් 208B යන ඕට්ටමාවඩි - -01 දකුණ ග්‍රාම සේවා නිළධාරි කොට්ඨාසය ද,
3. ඕට්ටමාවඩි - 02 ට අයත් 208C යන ඕට්ටමාවඩි - 02 ග්‍රාම සේවා නිළධාරි කොට්ඨාසය ද,
4. ඕට්ටමාවඩි - 03 ට අයත් 208 යන ඕට්ටමාවඩි - 03 ග්‍රාම සේවා නිළධාරි කොට්ඨාසය ද,
5. මීරාවෝඩේ බටහිරට ඇතුලත් මීරාවෝඩේ 207 බටහිර ග්‍රාම සේවා නිළධාරි කොට්ඨාසය ද,
6. මීරාවෝඩේ නැගෙනහිරට ඇතුලත් මීරාවෝඩේ 207B ග්‍රාම සේවා නිළධාරි කොට්ඨාසය ද

2016 වර්ෂයේ දී වරිපනම් බදු අයත්කර ගැනීමට හැකිවන පරිදි එම ප්‍රදේශ සංවර්ධනය වූ ප්‍රදේශ ලෙස ගැසට් නිවේදනය මගින් ප්‍රකාශකර වරිපනම් බදු අයකර ගැනීම සඳහා වර්ෂ 1987 හි අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥා පනතේ 134 වැනි ඡේදයේ පළමුවැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට පවරන ලද බලයේ ප්‍රතිඵලය අනුව සංවර්ධනය වූ ප්‍රදේශ ලෙස ප්‍රකාශ කිරීමට කෝරළේපත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ දී ඇතිකරගන්නා වූ සභා ඒකඟතාවයට අනුකූලව මඩකලපුව පළාත් පාලන සහකාර කොමසාරිස් වන කාසිප්පිල්ලයි චිත්‍රවේල් වන මා වරිපනම් බදු අයකර ගැනීම සඳහා සංවර්ධනවූ ප්‍රදේශ ලෙස මෙයින් ප්‍රකාශකරමි.

කාසිප්පිල්ලයි චිත්‍රවේල්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මඩකලපුව.

2015 දෙසැම්බර් මස 21 වැනි දින,

01-408

---

## පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව අතුරු ව්‍යවස්ථා නිවේදනය

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (1) වැනි උප වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) උපවගන්තිය ප්‍රකාරව 2015.12.16 වන දින අංක 109(04) යටතේ ගන්නා ලද තීරණය අනුව පහත සඳහන් තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ටී. සරත් වික්‍රමසිංහ,
ලේකම්,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් මස 16 දින

***තීරණය***

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත්, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 දින අංක 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව අතුරු ව්‍යවස්ථාව මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පල කරනු ලබන දින සිට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2015.12.16 වන දින 109 (04) යටතේ මෙයින් තීරණය කරමි.

01-314

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 හා 24 (2) වගන්තිය යටතේ කරන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය සභාව විසින් බලයලත් මිනින්දෝරු ප්‍රියන්ත පුංචිහේවා මහතා මගින් 2015.11.19 දින මැන සකස් කරන ලද අංක 10606 දරන පිඹුරට අනුව පහත උපලේඛනයේ සඳහන් මාර්ගය අකුරණ ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොද ඇති මෙම මාර්ගය සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශවයක් විසින් යම් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනයේ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස දැනුම් දෙනු ලැබේ.

ටී. එස්. රාජපක්ෂ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2015 දෙසැම්බර් මස 18 වැනි දින,
අලවතුගොඩ,
අකුරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

උපලේඛනය

| අනු. අංකය | මාර්ගයේ නම | දිග | පලල | මායිම් |
|---|---|---|---|---|
| 01 | හාලියල්ල හපුගස්හින්න වත්ත පාර පළමු එතැන් සිට | අඩි 46 1102 | අඩි 12 8 | *වම්පස :-* අකුරණ දුණුවිල ප්‍රධාන මාර්ගයේ හාලියල්ල අම්බලම සිට මීටර් 100 ක් නැගෙනහිරට ඇති හන්දියේ ආරම්භයේ සිට ඒ. එම්. ගාමිණී අබේරත්න මයාගේ ඉඩමට, කේ. ජී. එම්. ජී. දමයන්ති කුමාරි මියගේ ඉඩමට, එච්. එම්. කිරිබණ්ඩා මයාගේ ඉඩමට, ඒ. එම්. ජී. සෙනෙවිරත්න මයාගේ ඉඩමට සහ එච්. එම්. ටිකිරි බණ්ඩා මයාගේ ඉඩමට මායිම්වේ. *දකුණු පස :-* අකුරණ දුණුවිල ප්‍රධාන මාර්ගයේ හාලියල්ල අම්බලම සිට ආර්. එම්. ඩබ්. බී. ආර්. කපුලියද්ද මයාගේ ඉඩමට, ජී. එම්. යූ. රණසිංහ බණ්ඩා මයාගේ ඉඩමට එල්. ඩබ්. පී. ගුණරත්න මයාගේ ඉඩමට සහ ඩී. එම්. සෙනෙවිරත්න බණ්ඩා මයාගේ ඉඩමට මායිම් වේ. |

01-296

---

## කුරුණෑගල මහා නගර සභාවේ 1947 අංක 16 දරන මහා නගර සභා ආඥාපනතේ 90 වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරය) 90 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන භූමි සහ පුද්ගලික සුසාන භූමි පිළිබඳව ආඥා පනතෙහි 1 වන පරිච්ඡේදය 4 වන වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල මහ නගර සභාව විසින් මෙම පහත උපලේඛනයේ දක්වා ඇති මල්කඩුවාව පොදු සුසාන භූමිය කුරුණෑගල මහා නගර සභාව සතු පොදු සුසාන භූමිය ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට කුරුණෑගල මහා නගර සභාව විසින් මැන සලකුණු කර ඇති මෙම සුසාන භූමියේ මායිම් සම්බන්ධයෙන් කිසියම් පාර්ශවයක් විසින් යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය කර ලිත් මාසයක් ඇතුළත මා වෙත ඉදිරිපත් කරන ලෙස 1947 අංක 16 දරන මහා නගර සභා පනතේ 90 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ තිරගම් 10 කෝරලයේ කුරුණෑගල මහා නාගරිකයේ මඩමේගම පිහිටි කොටුවේ හේන නම් ඉඩම 2011.06.27 දින නැවත මැනීම කර බලයලත් මිනින්දෝරු කෝලිත ඩී. දසනායක විසින් මැන සාදන ලද අංක 1348 ඒ දරන පිඹුරේ පිළිවෙලින් පහත පරිදි ප්‍රමාණයන් හා මායිම් දැක්වෙන කැබලි අංක 01 සහ 02 යන කැබලි දෙකේ ඒකාබද්ධ ප්‍රමාණය අක්කර 10 රූඩ් 01 පර්චස් 26.1 හෙවත් හෙක්ටයාර් 4.21405 න් මල්කඩුවාව පොදු සුසාන භූමිය ලෙස භාවිතා කෙරේ. එකී කැබලි 02 පහත සඳහන් පරිදි වෙන් වෙන්ව විස්තර කෙරේ.

*කැබලි අංක 01 (ප්‍රමාණය අක්කර 07 රූඩ් 02, පර්චස් 09) ඃ*

| | | |
|---|---|---|
| උතුර | : | මීගමු පාර සහ මීගමු පාරෙන් කොළඹ පාරට සහ මහා නගර සභා මාර්ගය, |
| නැගෙනහිර | : | මීගමු පාරෙන් කොළඹ පාරට යන මහා නගර සභා මාර්ගය, |
| දකුණ | : | රාජිත ජයතිලක සහ තව අයට අයිති ඉඩම සහ කුරුණෑගල කාලගුණ දෙපාර්තමේන්තු කාර්යාලය, |
| බටහිර | : | රාජිත ජයතිලක සහ තව අයට අයිති ඉඩම සහ මීගමු පාර, |

කැබලි අංක 02 (ප්‍රමාණය අක්කර 02 රූඩ් 03 පර්චස් 17.1) ඃ

| | | |
|---|---|---|
| උතුර | : | මීගමු පාර සහ පෝරනේ වත්ත පාර, |
| නැගෙනහිර | : | පි.පි. 7764/3A සහ පි. පි. 7764/3 යන ඉඩම් කොටස්, |
| දකුණ | : | මීගමු පාරෙන් කොළඹ පාරට යන නගර සභා පාර සහ පි. පි. 7764/3B යන ඉඩම |
| බටහිර | : | මීගමු පාරෙන් කොළඹ පාරට යන මාර්ගය. |

ජී. කේ. එස්. චන්ද්‍රලතා,
නාගරික කොමසාරිස්,

මහා නගර සභාව,
කුරුණෑගල.

01-295

---

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත් වලට අදාළ ඉඩම් වල හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (11) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරෝධතාවයක් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජී. යූ. ගුණසිංහ,
ලේකම්/බලයලත් නිලධාරි.

උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

### උපලේඛනය

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණු පස පදිංචිකරුවන් | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|
| 01 | ආදාවල කොටඹේවත්ත පාර | කඩුගන්නාව ගම්පොල ප්‍රධාන මාර්ගය | ගයාත්‍රි වික්‍රමසිංහ මියගේ ඉඩම | සී. ඒ. වික්‍රමසිංහ | ජී. කේ. වික්‍රමසිංහ චින්තන සංජය වික්‍රමසිංහ | 150 | 7.5 |
| 02 | කලුවාදෙණිය අක්කර 18 (හෙට්ටියාවත්ත පාර) | ලගමුව කලුවාදෙණිය මාර්ගයේ එගොඩේරවත්ත සිට | අක්කර 18 දක්වා | ඩී. ජී. අබේසිංහ<br>එම්. ඩී. ජයසිංහ<br>ඩී. ජී. ප්‍රේමවතී<br>බී. ජී. රණතුංග<br>පී. ජී. අනුලාවතී | ඒ. ජී. එස්. එස්. විජේවික්‍රම<br>එස්. ජී. ගුණසිංහ<br>යූ. ජී. ජයන්ත රණසිංහ<br>යූ. ජී. විමලාවතී | 620 | 08 |
| 03 | දොඹේකොටුවේ වත්ත පාර | එකේ කණුව සිට හැපාන පාසල වෙත ඇති මුගටියාපොල පාර සිට | දොඹේකොටුව | ඩී. එච්. කීර්තිරත්න<br>ඩබ්. පී. එන්. චන්ද්‍රසිරි<br>ඩී. එස්. මහින්දරත්න<br>ඩී. එච්. ජී. එස්. ටී. කුමාර කරුණාරත්න | ඩී. එච්. ඒ. කරුණා රත්න<br>ඩී. එච්. ගාමිණී කරුණාරත්න<br>ඩී. එච්. සමරවීර | 200 | 13 |

01-433

# විවිධ දැන්වීම්

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු අයකිරීම - 2016 වර්ෂය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එච්. ජී. සත්‍යකාන්ති වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2015.11.02 දින පැවති කළමනාකරණ කමිටුව 17-5 යටතේ මම තීරණය කල බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන උපවගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කල ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2016 වර්ෂය සඳහා වූ තක්සේරුව/සත්‍යොක්ෂණය ලෙස සම්මත කල යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 134(1) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටනාකමින් සියයට 2.5% වාර්ෂික වරිපනම් බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

තව ද, 2016 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2016 එම වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් 5%ක වට්ටමක් ද ප්‍රාදේශීය සභාවට ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

එච්. ජී. සත්‍යකාන්ති
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2015 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | ජනවාරි 01-ජනවාරි 31 දක්වා | ජනවාරි 31 පෙර |
| දෙවන කාර්තුව | අප්‍රේල් - අප්‍රේල් 30 දක්වා | අප්‍රේල් 30 පෙර |
| තුන්වන කාර්තුව | ජුලි 01-ජුලි 31 දක්වා | ජුලි 31 පෙර |
| හතරවන කාර්තුව | ඔක්තෝබර් 01 - ඔක්තෝබර් 31 දක්වා | ඔක්තෝබර් 31 |

01-437/1

---

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

අක්කර බදු පැනවීම - 2016 වර්ෂය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් 2015 වර්ෂයේ නොවැම්බර් මස 02 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටුවේ යෝජනා අංක 17-2 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 උපලේඛනයේ (3) වන උපවගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී ජනරජයේ අංක 1687 හා 2010.11.31 දිනැති *ගැසට් පත්‍රය* යටතේ අක්කර බද්ද නියම කිරීම හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් ඇති ප්‍රදේශයෙහි හෙක්ටයාර් 01 වැඩි එහෙත් හෙක්ටයාර් 05 අඩු සෑම ඉඩමක් සඳහා ම 2016 වර්ෂය සඳහා

රු. 50 බැගින් ද, හෙක්ටයාර් 05 වැඩි වන ඉඩමක වැඩිවන සෑම හෙක්ටයාර් 01 සඳහාම රු. 10 බැගින් වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළ යුතු යැයි මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. ජී. සත්‍යකාන්ති,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2015 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-437/2

---

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2016 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2015.11.02 පැවති කළමණාකරන කමිටුවේ තීරණ අංක 17-4 මගින් මම තීරණය කරමින් ඒ බව මහජනතාව වෙත නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛණයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා ප්‍රාදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2016 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2016 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි මෙයින් දැනුම් දෙනු ලැබේ.

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2015 වර්ෂයේ ලැබීම්වලින් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2016 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

එච්. ජී. සත්‍යකාන්ති
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2015 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *බලපත්‍රයේ ස්වභාවය* | *රු. 750 ට නොවැඩි* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොවැඩි* | *රු. 1,500 ට වැඩි* |
|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| *අප්‍රසන්න ව්‍යාපාර :* | | | |
| 01. සුරුට්ටු හෝ බීඩි හෝ වෙළදාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. හම් පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. බිම්මල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. පපඩම් නිෂ්පාදනය කිරීමේ පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. බයිට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. වඩේ නිෂ්පාදනය කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. රස කැවිලි නිෂ්පාදනය හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. නූඩ්ල්ස් නිෂ්පාදනය හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. විනාකිරි නිෂ්පාදනය හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| *බලපත්‍රයේ ස්වභාවය* | *රු. 750 ට නොවැඩි* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොවැඩි* | *රු. 1,500 ට වැඩි* |
|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 10. ලුණු අලෙවි කිරීමේ හෝ පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. සිංහල බෙහෙත් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. ශීතකළ ඌරු මස් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. ශීතකල කුකුල්මස් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. ශීතකළ මාළු කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. බිත්තර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. බිත්තර වී නිෂ්පාදනය හෝ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 17. දේශීය ද්‍රව්‍ය මිලදී ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. සත්ව ආහාර අලෙවිසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. පොල්තෙල් ගබඩා කිරීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| *අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර :* | | | |
| 1. මෘත ශරීර බෙහෙත් ගැල්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. කොප්පරා මැස්සක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. දුම්කොළ වේලීම හෝ වෙළදාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. පොල්කටු අඟුරුවලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. මට්ටාවලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. හුණු පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. කළුගල් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. කළුගල් වලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. නිකල් අලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. මෝටර් රථ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. වැල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. තුනපහ ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. කුළියට පොල්තෙල් සිඳින මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. වී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. එළහරක් මස් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. එළු මස් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. ඌරු ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. එළු ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. හරක් ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. කරවල වෙළදාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. මස් ප්‍රවාහනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. සුරතල් මසුන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. පළතුරු බීම නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. තේ කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. හොජුන් හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීම හො අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. එළවළු වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. පළතුරු වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. පා පැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. ත්‍රිවිල් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. කෙටි කෑම අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. ඉංග්‍රීසි බෙහෙත් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. මැටි භාණ්ඩ අලෙවි කිරීම හා නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 41. සිල්ලර කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. ලොතරැයි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| *බලපත්‍රයේ ස්වභාවය* | *රු. 750 ට නොවැඩි* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 ට නොවැඩි* | *රු. 1,500 ට වැඩි* |
|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| *අන්තරාදායක ව්‍යාපාර :* | | | |
| 1. විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. ගඩොල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. ගෑස් වෙළදාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. පොල් ලී පැලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. කොහු ආශ්‍රිත නිෂ්පාදනය ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. තහඩු වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. ඇළුමිනියම් භාණ්ඩ නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. කුළියට වී කොටන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. ටයර් ටියුබ් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. හුණු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. සබන් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනය හෝ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. කුළියට ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. ඔරලෝසු අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. රූපලාවන්‍ය ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. පොල්ලෙලි කපන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. කජු පැකට් කර අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. පානීය ජල බෝතල් වෙළදාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. කියත් මුවහත් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

01-437/4

---

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

ව්‍යාපාර බදු පැනවීම - 2016 වර්ෂය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍ය ඉටුකරන ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එච්. ජී. සත්‍යකාන්ති වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2015.11.02 දින පැවති කළමණාකරන කමිටුවේ තීරණ අංක 17-4 මගින් මම තීරණය කරමින් ඒ බව මහජනතාව වෙත නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 152 වන උපවගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2016 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2015 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී 11 වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යයි මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ජී. සත්‍යකාන්ති,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2015 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *I වන තීරය* <br> *2015 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම* | *II වන තීරය* <br> *රු. ශත* |
|---|---|
| රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| රු. 6,000 ඉක්මවන එහෙත් රු. 1,2000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 300 0 |
| රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

*ව්‍යාපාරයේ ස්වභාවය :*

1. පොලිතින් හෝ ප්ලාස්ටික් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම
2. ස්වර්ණාභරණ වෙළඳ ස්ථානයක් පවත්වාගෙන යාම
3. වීදුරු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
4. මැටි භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
5. ඛණිජ තෙල් වෙළඳාමේ ස්ථානයක් පවත්වාගෙන යාම
6. මල් ශාලාවක් පවත්වාගෙන යාම
7. කොහුබත් ආශ්‍රිත නිෂ්පාදන අපනයන කරන ස්ථානයක් පවත්වාගෙන යාම
8. බැටරි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
9. කාපට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
10. වී තම්බා කොටන ස්ථානයක් පවත්වාගෙන යාම
11. ටයර්, ටියුබ් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
12. ලී වෙළඳාමක් පවත්වාගෙන යාම
13. මත්පැන් අලෙවිහලක් පවත්වාගෙන යාම
14. මිනිරන් පතලක් පවත්වාගෙන යාම
15. පැල තවානක් හෝ බීජ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
16. මල් හෝ විසිතුරු කැපූ පත්‍ර අපනයනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
17. වැලි නිෂ්පාදනය හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18. අලෙවි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
19. සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම
20. පොත් අලෙවි සැලක් පවත්වාගෙන යාම
21. ලිපිද්‍රව්‍ය අලෙවිසැලක් පවත්වාගෙන යාම
22. කොමියුනිකේෂන් එකක් පවත්වාගෙන යාම
23. පරිගණකය මගින් ලිපි මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
24. පරිගණක අලෙවි සැලක් පවත්වාගෙන යාම
25. පරිගණක මෘදුකාංග නිෂ්පාදනය හෝ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
26. ජ්‍යොතිෂ්‍ය කාර්යාලයක් පවත්වාගෙන යාම
27. සන්යුක්ත තැටි අලෙවිය හෝ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
28. නිවාස සැලසුම් ඇඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
29. ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
30. සිංහල බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
31. ධාන්‍ය වර්ග අලෙවිසැලක් පවත්වාගෙන යාම
32. තොග වශයෙන් සිල්ලර බඩු අලෙවි සැලක් පවත්වාගෙන යාම
33. යතුරු පැදි අමතර කොටස් අලෙවිසැලක් පවත්වාගෙන යාම
34. ත්‍රීවිල් අමතර කොටස් අලෙවිසැලක් පවත්වාගෙන යාම
35. මෝටර් රථ අමතර කොටස් අලෙවිසැලක් පවත්වාගෙන යාම
36. පාපැදි අමතර කොටස් අලෙවිසැලක් පවත්වාගෙන යාම
37. යතුරු පැදි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
38. ත්‍රීවිල් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
39. මෝටර් රථ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
40. පා පැදි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
41. බරවාහන අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
42. බරවාහන කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
43. වාහන බර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
44. වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
45. අවන්හලක් පවත්වාගෙන යාම
46. තෑගි භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
47. විදුලි උපකරණ අමතර කොටස් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
48. විදුලි උපකරණ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
49. රෙදි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
50. මසානිම කල ඇඳුම් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
51. මසානිම කළ ඇඳුම් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
52. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
53. පුවත්පත් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම
54. පරණ යකඩ හෝ බෝතල් හෝ පත්තර හෝ ප්ලාස්ටික් හෝ කාඩ්බෝඩ් මිලදී ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
55. සංචාරක වෙළඳාමක් පවත්වාගෙන යාම
56. පාවහන් වෙළඳසැලක් පවත්වාගෙන යාම
57. ගෘහ භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
58. පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
60. පිත්තල භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
61. පා පැදි හෝ යතුරු පැදි ගාල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
63. ඔට්ටු ඇල්ලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. උත්සව භාණ්ඩ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
66. ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67. සනීපාරක්ෂක භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
68. පොල් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. රියදුරු පාසලක් පවත්වාගෙන යාම
70. රක්ෂණ නියෝජිතයෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
71. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
72. උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
73. මුදල් අයෝජනය හෝ මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යාම
74. කොන්ත්‍රාත්කරුවකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
75. කොමිස් ඒජන්තවරයෙකු ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
76. වෙන්දේසිකරුවන් (ඉඩම්, වාහන, දේපළ) ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
77. දේශීය හෝ විදේශීය රැකියා ආයතනයක් පවත්වාගෙන යාම

78. පුහුණු පන්ති පැවැත්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
79. ව්‍යාපාරික කාර්යාලයක් පවත්වාගෙන යාම (වෛද්‍යවරු, නීතිඥවරු නොතාරිස්වරු, මිනින්දෝරුවරු)
80. පුද්ගලික පොලක් පවත්වාගෙන යාම
81. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
82. ප්‍රචාරක දැන්වීම් පුවරු නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම
83. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
84. සූර්යය බලශක්ති මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
85. අධිබලැති තරංග මගින් දුරකථන සම්ප්‍රේෂණය කිරීමේ කුළුනක් පවත්වාගෙන යාම
86. බැටරි වතුර නිෂ්පාදන හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
87. පොල් ලී වෙළදාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. පොල්තෙල් ආපනයනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
89. මෙට්ට අලෙවි කිරීම
90. කුරියර් සේවා සැපයීම
91. තින්ත වෙළදාම

01-437/5

---

### ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

#### කර්මාන්ත බදු පැනවීම - 2016 වර්ෂය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එච්. ජී. සත්‍යකාන්ති වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2015.11.02 වැනි පැවති කළමණාකරන කමිටුවේ තීරණ අංක 17-3 මගින් මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහිපහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2016 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

එච්. ජී. සත්‍යකාන්ති,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2015 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *1 වන තීරය* | *11 වන තීරය* | | |
|---|---|---|---|
| *කර්මාන්ත* | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
| | *රු. 750 නොඉක්මවන අවස්ථාවක දී රු. 500* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. 750* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. 1,000 0* |
| | *රු. ශ.* | *රු. ශ* | *රු. ශ.* |
| *කර්මාන්තයේ ස්වභාවය :* | | | |
| 01. වායු සමීකරණ යන්ත්‍ර, ශීත කරන නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ හා අලුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. සෙල්ලම් බඩු නිදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. වීදුරු භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. රබර් මිශ්‍ර මෙට්ටා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. විකිණීම සඳහා රථවාහන නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. මැටි භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. මැණික් මිලට ගැනීම හා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. කිරිහට්ටි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. කොහු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |

01-437/3

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

විනෝද බදු පැනවීම - 2016 වර්ෂය

විනෝද බදු ආඥාපනතේ 2 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ස්ථිර සිනමාශාලා මගින් අලෙවි කරනු ලබන ටිකට්පත් වල මුළු වටිනාකමින් 7.5% ක විනෝද බද්දක් ගෙවිය යුතු බවත් තාවකාලික ප්‍රදර්ශනය කරනු ලබන ආධාර චිත්‍රපටි දර්ශන මැජික් දර්ශන, සර්කස් දර්ශන සහ සෑම සංගීත දර්ශනයක් වෙනුවෙන් මුද්‍රණය කරනු ලබන ප්‍රවේශපත්‍රවල වටිනාකමින් 15% ක විනෝද බද්දක් අය කිරීම 2015.11.02 දින පැවති කළමණාකරන කමිටුවේ තීරණ අංක 17-6 යන තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ජී. සත්‍යකාන්ති,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2015 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-437/6

---

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2016 වර්ෂය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකුගේ හෝ ඔහුගේ සේවකයෙකු හෝ නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන් ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වන වගන්තිය අනුව විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක මාන බද්දක් විකුණුම්කරු හෝ සේවකයකු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයාගේ අනුයෝජිතයා විසින් ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි 2015.11.02 දින පැවති කළමණාකරන කමිටුවේ තීරණය අංක 17-7 මගින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. ජී. සත්‍යකාන්ති,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2015 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-437/7

---

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම-2016 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2016 වර්ෂයේ දී පහත උපලේඛනයේ 1 වන තීරුවේ නිරූපිත බද්දක් 2016 වර්ෂය සඳහා අයකළ යුතු යැයි 2015.11.02 දින පැවති කළමනාකරණ කමිටුවේ තීරණය අනුව අංක 17-8 මගින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. ජී. සත්‍යකාන්ති,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2015 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | *(1) තීරුව* | *රු. ශ.* |
|---|---|---|
| (i) | මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් ජින් රික්ෂෝවක්, බයිසිකලයක්, හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම | 25 0 |
| (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා | |
| | *(අ)* වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | *(ආ)* වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| (iii) | සෑම කරත්තයක් සඳහා | 20 0 |
| (iv) | සෑම අත්කරත්තයක් සඳහා | 10 0 |
| (v) | සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| (vi) | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු ම සඳහා | 15 0 |
| (vii) | සෑම ඇතෙකු සඳහා | 50 0 |
| (viii) | සෑම සුනඛයකු සඳහා | 20 0 |

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයෙදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

(3) ඉහත සඳහන් වන "වෙළඳ කාර්ය" යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

01-437/8

---

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

ගාස්තු පැනවීම- - 2016 වර්ෂය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් 2015.11.02 දින පැවති කළමණාකරන කමිටුවේ තීරණ අංක 17-9 මගින් පහත දැක්වෙන යෝජනාව ම විසින් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ජී. සත්‍යකාන්ති,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2015 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | *සේවා වර්ගය* | *ගාස්තුව* <br> *රු. ශ.* |
|---|---|---|
| 01. | දැව ප්‍රවාහනය වෙනුවෙන් සේවා නඩත්තු අරමුදල ලෙස එක් ගමන් වාරයක් සඳහා | 1,000 0 |
| 02. | ගොඩනැගිලි ඉල්ලුම්පත් | 250 0 |
| 03. | අනුකූලතා සහතික නිකුත් කිරීම | 300 0 |
| 04. | නල ළිඳක් ලියාපදිංචි කිරීමේ ගාස්තුව | 200 0 |
| 05. | ගිවිසුම් පිටපත් ගාස්තු | 200 0 |
| 06. | අනතුරුදායක ගසක් ඉවත් කිරීමේ ඉල්ලුම් පත්‍රය | 200 0 |
| 07. | ඉඩම් වෙන්දේසි ඉල්ලුම්පත් ගාස්තු | 5,000 0 |
| 08. | වැලි ප්‍රවාහනය වෙනුවෙන් මාර්ග නඩත්තු ගාස්තු (මාස 3ක් සඳහා) | 1,500 0 |
| 09. | වරිපනම් සංශෝධිත ඉල්ලුම්පත් ගාස්තු | 100 0 |
| 10. | අයිතිය තහනම් කර ගැනීමේ සහතික සඳහන් සමීක්ෂණ ගාස්තු | 100 0 |
| 11. | කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම | |
| | (i) රු. 1,00,000 ක් දක්වා | 1,000 0 |
| | (ii) රු. 1,00,000ක් ඉක්ම වූ කර්මාන්ත සඳහා | 2,000 0 |
| 12. | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 1,000 0 |

| | | රු. ශ. |
|---|---|---|
| 13. | (i) පා පැදි බලපත්‍ර ගාස්තු | 4 0 |
| | (ii) පා පැදි ස්ටිකර් ගාස්තු | 21 0 |
| 14. | (i) ත්‍රීවිල් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 100 0 |
| | (ii) ත්‍රීවිල් බලපත්‍ර ගාස්තු | 500 0 |
| 15. | පිඹුරු අනුමත කිරීම | 200 0 |
| 16. | විනෝද බදු ඉල්ලුම් පත්‍ර ගාස්තු | 200 0 |
| 17. | විථි රේඛා ඉල්ලුම් පත්‍ර ගාස්තු | 600 0 |
| 18. | ආදාහනාගාර ගාස්තු | |
| | (i) බල ප්‍රදේශයේ | 7,500 0 |
| | (ii) බල ප්‍රදේශයෙන් පිට | 9,000 0 |
| 21. | සභා බල ප්‍රදේශය තුළ මස් ප්‍රවාහනය කිරීම | 3,000 0 |
| 22. | සභාව සතු භූමියක සන්දර්ශන කටයුතු සඳහා යොද ගැනීම | 1,500 0 |
| 25. | හිස් ජල බවුසරය | 1059 0 |
| 26. | ජලය සහිත ජල බවුසරය | 1,359 0 |

01-437/9

---

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම - 2016 වර්ෂය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා 2016 වර්ෂයට පහත සඳහන් ආකාරයට ගාස්තු අය කළ යුතු බව 2015.11.02 දින පැවති කළමනාකරණ කමිටුව තීරණ අංක 17-13 මගින් තීරණය කරමින් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ජී. සත්‍යකාන්ති,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2015 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

දැන්වීම් පුවරු සඳහා අයකිරීම් පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| 01. | බිත්තියක් උපයෝගි කරගෙන කරනු ලබන ප්‍රචාරක දැන්විවම් වර්ග අඩියක් සඳහා | 50 0 |
| 02. | පුවරුවක් ආශ්‍රයෙන් ප්‍රදර්ශනය කරන ස්ථිර දැන්වීම් වර්ග අඩියක් සඳහා | 50 0 |
| 03. | රෙදි හෝ පොලිතින් යොදා ගැනීමෙන් කරනු ලබන තාවකාලික ප්‍රචාරක දැන්වීම් වර්ග අඩියක් සඳහා | 50 0 |

01-437/12

---

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

වෙළඳ ව්‍යාපාරික ස්ථානවල බදු පැනවීවම -2016 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 102 (1) වන වගන්තිය යටතේ සහ 1957 සෝ ඝාතක ආඥාපනතේ (111) පරිච්ඡේදයේ අංක 21 වගන්තිය ප්‍රකාර සෝ ඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම පිණිස 2016 වර්ෂයට ඉබ්බාගමුව බල ප්‍රදේශයේ පහත ස්ථාන සුදුසු බවට 2015.11.02 පැවති කළමනාකරණ කමිටුවේ තීරණ අංක 17-10 මගින් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

*සෝඝාතනාගාර :*

1. කුඹල්අංග කේ. එම්. තවුපික් මහතාට අයත් ඉඩමේ ගෝඝාතනාගාරය
2. තිත්තවැල්ගාල මහවත්ත එම්. එම්. සයිපුල්ලා මහතාට අයත් ගෝඝාතනාගාර
3. තිත්තවැල්ගාල මහවත්ත එම්. එස්. එම්. නිශාම් මහතාට අයත් ගෝඝාතනාගාර

*වෙළඳ ව්‍යාපාර ස්ථාන :*

1. හිරිපිටිය සතිපොල ගවමස් වෙළඳ සැල
2. පන්නල එම්. එම්. තවුපික් ගවමස් වෙළඳ සැල
3. කුඹුල්අංග එම්. එම්. තවුපික් ගවමස් වෙළඳ සැල
4. දේතිලි අංග එම්. එම්. තවුපික් ගවමස් වෙළඳ සැල
5. තිත්තවැල්ගාල අංක 01 මස් වෙළඳසැල
6. තිත්තවැල්ගාල අංක 02 මස් වෙළඳසැල

එච්. ජී. සත්‍යකාන්ති
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2015 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-437/10

## ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

### සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම -2016 වර්ෂය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව විසින් 2015.11.02 පැවති කළමනාකරණ කමිටුවේ තීරණ අංක 17-11 යටතේ බදු අයකිරීම සුදුසු බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

*(අ)* ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

*(ආ)* ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ

*(ඇ)* ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් යටත් වී ඇති බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1-4 වඩා අඩු වන්නේ නම්,

එහි ඉඩම් සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2016 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් 0.5% ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එහි සංවර්ධනය නොකළ ඉඩම් මත බද්දට 2016 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව විධානය කළ යුතු යැයි ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

එච්. ජී. සත්‍යකාන්ති,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2015 දෙසැම්බර් මස 22 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-437/11

---

## කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

### 2016 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල හා එම පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ 04 වන උපලේඛනය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු ගාස්තුව පහත ආකාරයට විය යුතු බවට මෙයින් නිවේදනය කරමි.

එච්. ඩී. ධර්මලතා,
ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2015 නොවැම්බර් මස 06 වැනි දින,
කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| | *රු. ශ.* |
| 1. මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| 2. සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ කරත්තයක් සඳහා - | |
| (*i*) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (*ii*) වෙළඳ කාර්යය නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| 3. සෑම කරත්තයක් සඳහා | 20 0 |
| 4. සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| 5. සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| 6. සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| 7. සෑම ඇතකු සඳහා | 50 0 |

01-342/7

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### 2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

2000 අංක 53 හා 1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වන වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව මධ්‍යම පරිසර අධිකාරිය මඟින් මා වෙත පැවරී ඇති බලතල අනුව කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදළව බලපත්‍ර ගාස්තු පහත ආකාරයට විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

එච්. ඩී. ධර්මලතා,
ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2015 නොවැම්බර් මස 06 වැනි දින,
කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

2000 අංක 53 හා 1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වන වගන්තිය යටතේ මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පනවා ඇති බලතල අනුව කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත ආරම්භකොට පවත්වාගෙන යනු ලබන පහත සඳහන් උපලේඛනයේ සඳහන් ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන්

ඉහත කී පනතේ අදාළ සංශෝධන යටතේ පවරා ඇති රෙගුලාසිවලට අනුකූලව එකී ව්‍යාපාර කර්මාන්ත පවත්වාගෙන යනු ලබන්නන් විසින් 2016 වර්ෂයට බලපත්‍රයක් ලබා ගත යුතු බවත්, එකී බලපත්‍රය වෙනුවෙන් පහත දැක්වෙන අනුප්‍රමාණ මත , පරීක්ෂණ ගාස්තුවක් පනවා අයකළ යුතු බවට තීරණය කරමි.

| *මූලික ආයෝජනය* | *පරීක්‍ෂණ ගාස්තු රු. ශත* |
|---|---|
| රු. 2,50,000 දක්වා | 3,000 0 |
| රු. 2,50,001 - 5,00,000 දක්වා | 3,750 0 |
| රු. 5,00,001 - 10,00,000 දක්වා | 5,000 0 |
| රු. 10,00,000 ට ඉහළ | 10,000 0 |
| වර්ෂ තුනකින් බලපත්‍රය අළුත් කිරීමේ ගාස්තුව | 4,000 0 |

### උපලේඛනය

1. සියලුම වාහන ඉන්ධන පිරවුම් හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු)
2. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල්තෙල් සිඳීමේ කර්මාන්ත
4. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
5. වියළි ක්‍රියාවලි සහිත වී මෝල්
6. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 1,000 කට අඩුවන ඇඹරුම් හල්
7. දුම්කොළ වේලීමේ කර්මාන්ත
8. සල්ෆර් දුම් ගැසීම් සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 500 හෝ එයට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
9. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත
10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
11. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් හැර අනෙකුත් කර්මාන්ත ශාලා
13. දිනකට මෙට්‍රික් ටොන් 20ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත හුණු පෝරණු
14. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයින් 25ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
15. සියලු බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත
16. උළු සහ ගඩොල් කර්මාන්ත
17. එක් වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරනු ලබන කැණීම්
18. දිනකට ඝන මීටර් 50ට අඩු දැව ඉරුම් ධාරිතාවයක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත
19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 5ට වැඩි 25ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
20. නේවාසික කාමර 05 හෝ ඊට වැඩි සහ 20ට අඩු හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්
21. වාහනවල වායුසමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ හා සවිකිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සිදු කරන ගරාජ හැර අනිකුත් වාහන අලුත්වැඩියා කිරීමේ/නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ
22. ශීතකරණ හා වායුසමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සවිකිරීම සිදුකරන ස්ථාන
23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලුම් පර්යන්ත
24. සේවකයින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථාන
25. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර.

01-342/9

---

### කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා විනෝද බදු අය කිරීම

1946 අංක 12 දරන විනෝද ආඥාපනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා එකී පනතේ 7(1) වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදාළව විනෝද බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට නිවේදනය කරමි.

එච්. ඩී. ධර්මලතා,
ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2015 නොවැම්බර් මස 06 වැනි දින,
කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

1946 අංක 12 දරන විනෝද ආඥාපනතේ 9(3) වගන්තිය හා එකී පනතේ 2(1) වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ප්‍රසංගවලට ඇතුළත්වීමට අයකරනු ලබන ගාස්තුවෙන් සියයට දහයක (10%) විනෝද බද්දක් ද ප්‍රසිද්ධ සංදර්ශන ආඥාපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර පහත දක්වා ඇති අනුප්‍රමාණ මත ප්‍රසිද්ධ සංදර්ශන මගින් බලපත්‍ර ගාස්තුවක් 2016 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි තීරණය කරමි.

01. චිත්‍රපට සංදර්ශන (තාවකාලික) සර්කස් සංදර්ශන, මැජික් සංදර්ශන, නාට්‍ය දර්ශන සඳහා දිනකට රු. 500 ක්, වැඩි වන සෑම දිනකටම රු. 250 බැගින් ද,

02. සංගීත සංදර්ශනයකට එක් දිනකට රු. 500ක් ද වේ.

01-342/5

---

### කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා එම පනතේ 154(1) වගන්තිය යටතේ

පැවරී ඇති බලතල ප්‍රකාරව කරන්දෙනිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදලව ඉඩම් විකිණීම මත බදු අයකිරීමට නියම කිරීමට පහත සඳහන් ආකාරයට විය යුතු බවට නිවේදනය කරමි.

එච්. ඩී. ධර්මලතා,
ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2015 නොවැම්බර් මස 06 වැනි දින,
කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය හා එකී පනතේ 154(1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ යම් ඉඩමක් තක්සේරුකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) සමාන බදු මුදලක් (විකුණුම්කරු හෝ තැරැව්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින්) 2016 වර්ෂය සඳහා පනවා අයකළ යුතුයැයි තීරණය කරමි.

01-342/4

---

## කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා ව්‍යාපාරික බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා එම පනතේ 152(1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට ව්‍යාපාර බදු පහත ආකාරයට විය යුතු බවට මෙයින් නිවේදනය කරමි.

එච්. ඩී. ධර්මලතා,
ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2015 නොවැම්බර් මස 06 වැනි දින,
කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ කියවිය යුතු එකී පනතේ 152(1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ යම් ව්‍යාපාරයක් කරන්දෙණිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2016 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2015 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවතින අවස්ථාවක එකී 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2016 වර්ෂය සඳහා අයකළ යුතු බවට තීරණය කරමි.

*උපලේඛනය*

| *I වන තීරුව* බද්ද අදාල වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයේ ලත් ලැබීම් ප්‍රමාණය | *II වන තීරුව* ගෙවිය යුතු බද්ද රු. ශත |
|---|---|
| 01. රු. 6,000 නොඉක්මවන | නැත |
| 02. රු. 6,000 ඉක්මවන රු. 12,000 නොඉක්මවන | 90 0 |
| 03. රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන | 180 0 |
| 04. රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන | 360 0 |
| 05. රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන | 1,200 0 |
| 06. රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

ඉහත සඳහන් බද්ද අදාළ වන ව්‍යාපාර පහත දැක්වේ.-

1. කොමිස් ඒජන්තවරු
2. ඉඩම් හා දේපළ වෙන්දේසිකරුවන්
3. බ්‍රෝකර්වරුන්
4. මුදල් ආයෝජකයින්
5. උකස් බඩු ගන්නවුන්
6. කොන්ත්‍රාත්කරුවන්
7. රියදුරු පුහුණුකරුවන්
8. රක්ෂණ නියෝජිතයින්
9. ලොතරැයි අලෙවි නියෝජිතයින්
10. මෝටර් රථ ගෙන්වීම හා විකිණීම
11. පෞද්ගලික අධ්‍යාපන ආයතනය
12. දේශීය හා විදේශීය රැකියා ඒජන්සිකරුවන්
13. කුලී රථ සේවා ආයතනයක් පැවැත්වීම
14. නීතිඥවරුන්, නොතාරිස්වරුන් හා මිනින්දෝරුවන්
15. වාණිජ හා ඉතිරිකිරීම් බැංකු
16. ගණන් පරීක්ෂකවරුන්
17. ශාරීරික යෝග්‍යතා මධ්‍යස්ථාන
18. තොග හා සිල්ලර වෙළඳාම
19. සිමෙන්ති ගබඩා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
20. ශබ්ද වාහිනී යන්ත්‍ර, පුටු කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
21. ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
22. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
23. මණිබඩු, සාප්පු බඩු හෝ සුවඳ විලවුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
24. සිල්ලර කඩයක් පවත්වාගෙන යාම
25. එළවළු හෝ පළතුරු කඩයක් පවත්වාගෙන යාම
26. දුරකථන තරංග සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම
27. දුම්කොළ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
28. මල් පැළ හා මල් විකිණීම
29. පුවත්පත් ලොතරැයි නියෝජිත ස්ථානයක් හෝ සංචාරක ආයතනයක් පවත්වාගෙන යාම
30. දේපළ වෙළඳාම් ස්ථානයක් පවත්වාගෙන යාම
31. මෝටර් සයිකල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32. පා පැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
33. කුෂන් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම
34. පින්තූර රාමු කිරීම
35. විදුලි උපකරණ අලෙවිසැලක් පවත්වාගෙන යාම

36. රන් ආභරණ විකිණීමේ ජුවලරි සාප්පුවක් පවත්වාගෙන යාම
37. විකිණීම සඳහා වළං ගබඩා කිරීම
38. ට්‍රැක්ටර් අලෙවි නියෝජිත
39. බියුටි සෙන්ටර් එකක් පවත්වාගෙන යාම
40. නිවාස සැලසුම් ඇඳීම හා ගෘහ නිර්මාණ ඇස්තමේන්තු පිළියෙල කිරීම
41. වීඩියෝ කැසට් පටි ගබඩා කිරීම හා විකිණීම
42. රට උළු ගබඩා කිරීම හා විකිණීම
43. තේ කුඩු පැකට් කිරීම
44. බ්‍රේක් ලයිනින් නිපදවීම හෝ අළුත්වැඩියාව
45. ප්‍රචාරක සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
46. ඒජන්සි තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
47. උත්සව සඳහා ආහාර සැපයීම
48. කිරි, පැණි විකිණීම සඳහා ගබඩා කිරීම
49. පැපැදි අමතර කොටස් විකිණීම
50. විසිතුරු භාණ්ඩ හෝ සෙල්ලම් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. පරිගණක සේවා ආයතනයක් පවත්වාගෙන යාම
52. සුරතල් සතුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. අමු තේ දළු මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. පරිගණක අළුත්වැඩියා කිරීම
55. කට්ට පතුරු වෙළඳසැල්
56. සුළු සිල්ලර වෙළඳසැල්
57. ගඩොල් හෝ උළු ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. වී කෙටීමේ හෝ ධාන්‍ය ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59. වීදුරු තහඩු ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. සිසිල්බීම තොග වශයෙන් බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කිරීම
63. සිනමා ශාලාවක් පවත්වාගෙන යාම
64. විදුලි කාර්මික වැඩපලක්, ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම
66. මෝටර් රථ අමතර කොටස් විකිණීම
67. මෝටර් බයිසිකල් අමතර කොටස් විකිණීම
68. පොල් ගබඩා කිරීම හා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
69. භූමිතෙල් ගබඩාවක් පවත්වාගෙන යාම
70. කුලියට දීම සඳහා මඩු හා පුටු තබා ගැනීම
71. නොතාරිස් කාර්යාලයක් පවත්වාගෙන යාම
72. කුරුඳු මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
73. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම
74. ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම
75. රබර් වේලන ස්ථානයක් පවත්වාගෙන යාම
76. අවමංගල්‍ය භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
77. පටිගත කිරීමේ, තැටිගත කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
78. කුරුඳුතෙල් මිලට ගැනීම හා ගබඩා කිරීම
79. පැරණි ගෘහ භාණ්ඩ (ඇන්ටික්ස්) ගබඩා කිරීම
80. මාළු කොටුවක් පවත්වාගෙන යාම
81. ක්ෂණික ඡායා පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. කිරිහලක් පවත්වාගෙන යාම
83. කොප්පරා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
84. කොහු වේලීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
85. පාවිච්චි කරන ලද පත්තර හෝ කඩදාසි ගබඩා කර තැබීම
86. ලී කැටයම් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
87. පූජා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම
89. ෆිනෑන්ස් ආයතනයක් පවත්වාගෙන යාම
90. විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
91. බිම්මල් නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
92. රබර් මිලයට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
93. ජංගම දුරකථන අලෙවිසැලක් පවත්වාගෙන යාම
94. ජංගම දුරකථන සේවා කුටියක් පවත්වාගෙන යාම
95. වෙසක් කාඩ්පත් හා මල් විකිණීමේ වෙළඳසැලක් පවත්වාගෙන යාම
96. තාවකාලික වෙළඳසැලක් පවත්වාගෙන යාම (ජංගම)
97. රන් රිදී භාණ්ඩ ආලේප කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
98. රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
99. පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
100. විදුලි බලයෙන් ක්‍රියාකරන උපාංග බදු දීම
101. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
102. දර ගබඩාවක් මඩුවක් පවත්වාගෙන යාම
103. ප්ලාස්ටික් භාණ්ඩ අලෙවි සැල
104. මැහුම් පුහුණු පාඨමාලා පැවැත්වීම
105. කුරුඳු බේල් කිරීම හා දුම් ගැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
106. පාවහන් නිෂ්පාදන කර්මාන්ත ශාලාවත් පවත්වාගෙන යාම
107. නවාතැන්හලක් පවත්වාගෙන යාම
108. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම (රෙදිපිළි)

01-342/3

---

## කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

### 2016 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල හා එම පනතේ 150(1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදාලව කර්මාන්ත බදු නියම කිරීම පහත ආකාරයට විය යුතු බවට මෙයින් නිවේදනය කරමි.

එච්. ඩී. ධර්මලතා,
ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2015 නොවැම්බර් මස 06 වැනි දින,
කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා එකී පනතේ 150(1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි 1 වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි තීරණය කරමි.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| *අනු. අංකය* | *බලපත්‍රයේ ස්වභාවය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | රසකැවිලි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |
| 2. | බතික් වැඩපලක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 3. | යෝගට් නිෂ්පාදනය | 300 0 | 400 0 | 500 0 |
| 4. | ප්ලාස්ටික් නාම පුවරු නිපදවීම | 300 0 | 400 0 | 500 0 |
| 7. | සිමෙන්ති යොදා යාන්ත්‍රික බ්ලොක් ගල් සෑදීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | පොල් තෙල් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 900 0 |
| 9. | සරුවත්, සිසිල් බීම නිෂ්පාදනය කිරීම | 300 0 | 350 0 | 450 0 |
| 10. | පපඩම් නිෂ්පාදනය කිරීම | 400 0 | 500 0 | 600 0 |
| 11. | සබන් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | බිස්කට් වර්ග නිෂ්පාදනය කිරීම | 400 0 | 525 0 | 650 0 |
| 13. | බීරළු නිෂ්පාදනය කිරීම | 425 0 | 450 0 | 475 0 |
| 15. | බීම පැකට් හා අයිස් පැකට් නිෂ්පාදනය කිරීම | 400 0 | 450 0 | 500 0 |
| 16. | පොල්කටු හැඳි නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරය | 250 0 | 350 0 | 450 0 |
| 17. | වේවැල් බඩු නිපදවීමේ හා ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 18. | ශල්‍ය ගෝස් රෙදි විවීමේ නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | මාළු ටැංකි නිෂ්පාදනය | 300 0 | 400 0 | 500 0 |
| 22. | හඳුන්කූරු නිෂ්පාදනය | 225 0 | 250 0 | 275 0 |
| 23. | ලෑලි පෙට්ටි හෝ තේ පෙට්ටි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |
| 24. | ඇස් කණ්නාඩි නිෂ්පාදනය කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 26. | යන්ත්‍ර නොමැතිව සපත්තු, පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 400 0 |
| 27. | බේකරි සඳහා අවශ්‍ය තැටි වර්ග හා බෙලෙක් තහඩුමය නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 28. | පානීය ජලය බෝතල් ඇසුරුම් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 29. | රබර් සීල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 400 0 |
| 30. | සෙරමික් සහ පෝසිලේන් භාණ්ඩ විකිණීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | සුදු යකඩ උපයෝගී කරගෙන කරන ලද නිෂ්පාදන ආයතනයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | ඇඟළුම් කර්මාන්තශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | ඉදල්, කොහු, බුරුසු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | කම්මලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | යන්ත්‍රානුසාරයෙන් ගඩොල් හෝ උළු පිලිස්සීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

01-342/2

**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව**

2016 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල හා එම පනතේ 147 හා 149 වගන්ති යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2016 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පහත ආකාරයට විය යුතු බවට මෙයින් නිවේදනය කරමි.

එච්. ඩී. ධර්මලතා,<br>ලේකම්,<br>කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2015 නොවැම්බර් මස 06 වැනි දින,<br>කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 හා 149 වැනි වගන්ති යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් භාවිත කිරීමට බලය දෙමින් 2016 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ 11 තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු බවට තීරණය කරමි.

***උපලේඛනය***

| *I වැනි තීරුව* | | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| *අනු. අංකය* | *බලපත්‍රයේ ස්වභාවය* | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | හුණු පිළිස්සීම, සකස් කිරීම හෝ විකිණීම සඳහා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | කුකුළන් හෝ කිකිළියන් 100ට වැඩි ගාලක් හෝ කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | කිරි පට්ටියක්, ගව ගාලක්, ඌරු කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | යතුරු පැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | පා පැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ටයර් හෝ ටියුබ් වෝල්කනයිසින් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | මෝටර් වාහන අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | බැටරි චාජ් කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | බාබර් සාප්පුවක් හෝ කොණ්ඩ කපන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ස්වර්ණාභරණ නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පෙට්‍රල් හෝ ඩීසල් හෝ වෙනත් ඛනිජ තෙල් ගබඩා කිරීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | රබර් ෂීට් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග නිපදවීමේ, තබා ගැනීමේ සහ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | නවාතැන්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | තේ, කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| I වැනි තීරුව | | II වැනි තීරුව | | |
|---|---|---|---|---|
| | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| අනු. අංකය | බලපත්‍රයේ ස්වභාවය | රු. 750 නොඉක්මවන අවස්ථාවක | රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක | රු. 1,500 ඉක්මවන අවස්ථාවක |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 23. | යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය, මාංශ හෝ බෙහෙත් ද්‍රව්‍ය ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | කෘෂි රසායනික ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙනයාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | අළුත් හෝ පාවිච්චි කරන ලද ටයර් හෝ ටියුබ්ස් විකිණීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ව්‍යාපාර සඳහා කොන්ක්‍රීට් ගල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | ශීතකල බීම හා ආහාර වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | මස් කඩයක් පවත්වාගෙන යාම (කුකුළු) | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | කබොක්, බොරළු, හෝ කළුගල් කැඩීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | සාමාන්‍ය ලී ඉරුම් හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | ලී ඉරීමේ ජංගම කර්මාන්ත ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | කුරුඳුතෙල් නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | කුරුඳු මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | ලියවන පට්ටලයක් සහිත මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | පෞද්ගලික වෙළඳපොලක් පවත්වාගෙන යාම/සතිපොළක් පවත්වාගෙනයාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ජුකි මැෂින් ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (මැෂින් 01ට වැඩි) | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | පැරණි ලෝහ භාණ්ඩ, පිත්තල, ඇලුමිනියම්, යකඩ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | වැලි ගොඩදාන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | එල්. පී. ගෑස් විකිණීම හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | සිගරට් බෙදාහැරීමේ ව්‍යාපාරයක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | කෘතිම පොහොර නිපදවීමේ හෝ මිශ්‍ර කිරීම සඳහා ස්ථානයක් පවත්වගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | රෙදිපිළි මෝස්තර මුද්‍රණය හා පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | ශීතකරණ හා අධි ශීතකරණ අළුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | මාළු අයිස් දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | ගල්වලින් ස්මාරක හා මිරිස් ගල් වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | මිරිස් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | කොහුමෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | පොල්ලෙලි පෙඟවීම සඳහා මට්ටවලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | ගඩොල් පිළිස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | යකඩ බඩු කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | මෝටර් රථ පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | සුළු පරිමාණයේ රේස් ඔට්ටුපලවල් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | මෝටර් වාහන සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | චීන ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | රටබීම විකිණීම, වයින් ස්ටෝර්ස් එකක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | රේස් බයි රේස් ඔට්ටුපොලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | ඉන්ධන පිරවුම්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | උත්සව ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | යන්ත්‍රානුසාරයෙන් ගල් මෝලක්, ගල් පිරවුම් ස්ථානයක්, කළුගල් වැඩපලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | හරක් මස් කඩයක්/ගෝඝාතනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | ලී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | ඉංග්‍රීසි බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ෆාමසියක්) | 500 0 | 750 0 | 1,000 0 |

| | I වැනි තීරුව | II වැනි තීරුව | | |
|---|---|---|---|---|
| | | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| අනු. අංකය | බලපත්‍රයේ ස්වභාවය | රු. 750 නොඉක්මවන අවස්ථාවක | රු. 750 ඉක්මවන එහෙත් 1,500 නොඉක්මවන අවස්ථාවක | රු. 1,500 ඉක්මවන අවස්ථාවක |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 67. | වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 70. | ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීමේ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | සංචාරක වෙළඳාමක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 73. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 74. | වාත්තු වැඩපලක් පවත්වාගෙනයාම | 500 0 | 750 0 | 1,000 0 |
| 75. | ගුවන් විදුලි හා රූපවාහිනී අලුත්වැඩියාවන් සිදු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 76. | වාහන පින්තාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | තීන්ත වර්ග විකිණීම හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 78. | ෆයිබර් වැඩපලක් පවත්වානෙ යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 79. | කරවල විකිණීමේ ස්ථානයක් පවත්වානෙ යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 80. | බැටළුවන්, ඌරන් සහ ගවයින් 10-100 අතර ඇති ගාලක් හෝ කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 81. | කුළු බඩු පැකට් කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 82. | නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 83. | ගෘහ විදුලි උපකරණ අලෙවි සැල් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 84. | සුරුට්ටු නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 85. | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 86. | පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 87. | ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 88. | ත්‍රිවීල් රථයක්, කුලී රථයක් වෙළඳ කටයුතු සඳහා යොදා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 89. | ට්‍රේලර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 90. | වී කෙටීමේ හෝ ධාන්‍ය ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 91. | කුරුඳු මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 92. | රූපලාවන්‍ය ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 93. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 94. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

01-342/1

---

## කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල හා එම පනතේ 134(3) උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ 2016 වර්ෂයට අක්කර බදු පහත ආකාරයට විය යුතු බවට මෙයින් නිවේදනය කරමි.

එච්. ඩී. ධර්මලතා,
ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2015 නොවැම්බර් මස 06 වැනි දින,
කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ කියවිය යුතු එකී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ විට ඉඩමක් වෙනුවෙන් එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම වන 2016 වර්ෂය සඳහා රු. 10 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත් ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධිවිධාන යටතේ පළාත් පාලන විෂයය භාර ගරු අමාත්‍යතුමා විසින් කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ 1989.02.03 දිනැති *ගැසට් පත්‍රයේ* iv(ආ) වන කොටසේ ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක්ම වන, 2016 වර්ෂය සඳහා රු. 50ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකළ යුතු බවට තීරණය කරමි.

තව ද, ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් 2016 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවට තීරණය කරමි.

01-342/8

---

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### 2016 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් වන ටී. එල්. කේ. ඩී. ලේකම්ගේ මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 153 වගන්තිය ප්‍රකාරව, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාර වශයෙන් 2016 වර්ෂයට අදළ වරිපනම් පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2015 ක් වූ නොවැම්බර් මස 16 වැනි දින තීරණ අංක 01 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

ටී. එල්. කේ. සී. ලේකම්ගේ,
ලේකම්,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2015 නොවැම්බර් මස 16 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ටී. එල්. කේ. ඩී. ලේකම්ගේ වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමා තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 0.5% වන බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) (ආ) ඡේදය යටතේ වන "සමානුපාතය" වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1:5 විය යුතු බවටත්, තීරණය කරමි.

01-297/7

---

## තුම්පනේ ප්‍රාදේශීය සභාව

### 2016 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2015 වර්ෂයේ දෙසැම්බර් මස 08 වැනි දින මාගේ අංක 73 දරන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනයකරනු ලැබේ.

2016 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවටත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජී. වී. මල්ලිකා සේනාරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් මස 10 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීඹ අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2016 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි උපලේඛනයේ 1 තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2016 වර්ෂයේ අප්‍රේල් 30 වන දිනට පෙර තුම්පනේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

*I උපලේඛනය*

| *ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම්* | | *ගෙවිය යුතු මුදල* |
|---|---|---|
| 01. | රු. 6,000 සිට රු. 11,999 දක්වා | 90 0 |
| 02. | රු. 12,000 සිට 18,749 දක්වා | 180 0 |
| 03. | රු. 18,750 සිට රු. 74,999 දක්වා | 360 0 |
| 04. | රු. 75,000 සිට රු. 1,49,999 දක්වා | 1,200 0 |
| 05. | රු. 1,50,000 ඉහළට | 3,000 0 |

01-435/3

---

**තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර**

2016 වර්ෂය සඳහා වරිපනම් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2015 වර්ෂයේ දෙසැම්බර් මස 08 වන දින මාගේ අංක 74 දරන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2016 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම, මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2016 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2016 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහය (10%)ක වට්ටමක් ද එක් එක් කාර්තුවකට අදාල වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%)ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

ජී. වී. මල්ලිකා සේනාරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් මස 10 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් සඳහා නම් කළ සියළුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2015 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම් 2016 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින්

1. ගලගෙදර කොට්ඨාශයේ
   රඹුක්කන පාර (වම/දකුණ), මල්පොලයාය පාර
   පෙතිගේවෙල පාර (වම/දකුණ), මැදගොඩ පාර
   පොහොලියද්ද පාර (වම/දකුණ)
   වැත්තෑව පාර (වම/දකුණ)
   විද්‍යාල පාර (වම/දකුණ)
   උසාවිය පාර (වම/දකුණ)
   කුරුණෑගල පාර (වම/දකුණ) සහ
   කුරුණෑගල හරස් පාර (වම/දකුණ) යන මාර්ගවල පිහිටි සෑම නිශ්චල දේපලක් මත සියයට දහය (10%) වරිපනමක් ද,

2. ගලගෙදර කොට්ඨාශයේ
විහාරතැන්න පාර (වම/දකුණ) කොහිලඇල්ල පාර
ගොඩලියද්ද පාර (වම/දකුණ) නිදහස් පටුමග
නුවර පාර (වම/දකුණ) අක්කරේ පාර
මාළුස්සාව පාර (වම/දකුණ) නුවර පාර

3. අරඹේකඩේ කොට්ඨාශයේ
කටුගස්තොට පාර (වම/දකුණ) බොක්කාවල පාර
බොක්කාවල පාර (වම/දකුණ) හැදෙනිය මැදවල පාර කුරුණෑගල පාර (වම/දකුණ) සහ

4. හතරලියද්ද කොට්ඨාශයේ
නුවර පාර (වම/දකුණ)
රඹුක්කන පාර (වම/දකුණ)
සංසරාජපුර පාර (වම/දකුණ)

යන කොට්ඨාශවල පිහිටි සෑම නිශ්චල දේපලක් මත සියයට පහක (5%) ක වරිපනමක් ද,

2016 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් සහ ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් තීරණය කරමි.

01-435/4

---

**තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර**

2016 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2015 වර්ෂයේ දෙසැම්බර් මස 08 වන දින මාගේ අංක 75 දරන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබාගන්නා සෑම තැනැත්තෙකු ම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබාගන්නා දින ගණන දින තිහක් සම්පූර්ණ වූ වහාම 2016 වර්ෂය සඳහා වන මෙම බද්ද තුම්පනේ ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ජී. වී. මල්ලිකා සේනාරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් මස 10 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2016 වර්ෂයේ දී පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබාගන්නා සෑම තැනැත්තෙකු ගෙන්ම එහි 11 වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2016 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරමි.

***උපලේඛනය***

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* <br> *රු. ශ.* |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ කරත්තයක් සඳහා - | |
| (අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) වෙළඳ කාර්ය නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| සෑම කරත්තයක් සඳහා | 20 0 |
| සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| සෑම ඇතකු සඳහා | 50 0 |

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

01-435/5

**තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර**

2011.05.30 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1708/10 දරන *ගැසට් පත්‍රයේ* 4(අ) වැනි කොටසේ පළකරන ලද කුලී රථවාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ වගන්ති අනුව කුලී රථවාහන නවතා තැබීම සඳහා මසකට ගාස්තු පැනවීම සඳහා 2015 දෙසැම්බර් 08 වැනි දිනැති හා අංක 76 දරන පහත තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ජී. වී. මල්ලිකා සේනාරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් මස 10 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | ත්‍රී රෝද රථගාල් ගාස්තු - එක් ත්‍රී රෝද රථයකට මාසික ගාස්තුව | 150 0 |
| 02. | ලොරි රථයක් සඳහා මසකට | 500 0 |
| 03. | වෑන් රථයක් සඳහා මසකට | 500 0 |
| 04. | ටේලරය සහිත ට්‍රැක්ටරයක් සඳහා මසකට | 250 0 |
| 05. | අත්ට්‍රැක්ටරයක් සඳහා මසකට | 250 0 |
| 06. | කාරයක් සඳහා මසකට | 500 0 |

01-435/6

---

**තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර**

**1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර ලබාදීමේ පනත**

මෙහි වූ උපලේඛනයෙහි සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාව සඳහා 2016 වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කරන ලෙස මා වෙත ඉල්ලුම්පතක් ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍රදීමේ පනතේ 6 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලාව අසල හෝ එකී සමාජශාලාව සඳහා අපේක්ෂිත ස්ථාන අසල හෝ පදිංචි යම් තැනැත්තෙකු එකී සමාජශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දිනයේ සිට සති 04ක් ඇතුළත තම විරුද්ධතාවයට හේතු ලියවිල්ලකින් දක්වමින් පිටපත් දෙකකින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

ජී. වී. මල්ලිකා සේනාරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් මස 10 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපතිද ලේකම්, කළමනාකරුද යන වග* | *සමාජ ශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තුවන ස්ථානය* |
|---|---|---|---|
| ජෙරම් කෙනත් ප්‍රනාන්දු මයා<br>රොස්වුඩ්වත්ත<br>රත්කරව්ව. | සභාපති | මවුන්ට්වීව් සමාජශාලාව | 33, කුරුණෑගල පාර, ගලගෙදර |

01-435/7

## තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2015 වර්ෂයේ දෙසැම්බර් මස 08 වන දින මාගේ අංක 77 දරන තීරණය මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජී. වී. මල්ලිකා සේනාරත්න,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් මස 10 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### තීරණය

තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් 2016 වර්ෂය තුළ දී සපයනු ලබන සේවාවන් වෙනුවෙන් පහත සඳහන් ගාස්තු පනවා අයකිරීමට තීරණය කරමි.

| | | | |
|---|---|---|---|
| දැන්වීම් පුවරු සඳහා ගාස්තු | | | |
| 01. | 1. | තහඩුවලින් එක් පැත්තක් සඳහා වසරකට වර්ග අඩි එකක් වෙනුවෙන් | 125 0 |
| | 2. | තහඩුවලින් දෙපැත්තක් සඳහා වසරකට වර්ග අඩි එකක් වෙනුවෙන් | 150 0 |
| | 3. | ජංගම දුරකථන සම්බන්ධ දැන්වීම් පුවරු වර්ග අඩි එකක් වෙනුවෙන් | 125 0 |
| | 4. | කිසියම් ව්‍යාපාරයක වෙළඳ නාමයට අමතරව වෙනත් වෙළඳ නිෂ්පාදන ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා වර්ග අඩි එකක් වෙනුවෙන් | 30 0 |
| | 5. | රෙදි බැනර් සඳහා මාසයක කාලයකට වර්ග අඩි එකක් වෙනුවෙන් | 30 0 |
| පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු | | | |
| 02. | 1. | නව ව්‍යාපාරයක් සඳහා ඉල්ලුම්පත් සඳහා | 500 0 |
| | 2. | පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීමේ ඉල්ලුම්පත් ගාස්තුව | 500 0 |
| | 3. | පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සඳහා වසර 03කට ගාස්තුව | 4,000 0 |
| | 4. | වරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාදීමේ පරීක්ෂණ ගාස්තු (මහා සභාවේ තීරණය අනුව අවමය රු. 1,000 උපරිමය රු. 10,000 කි) | 3,000 0 |
| 03. | | නොපරවා ගැනීමේ සහ වීරිරේඛා සහතිකයක් ලබාදීම සඳහා (මෙම සහතිකය මාස හයක (06) කාලයක් වලංගුවේ) | 750 0 |
| 04. | | මිනින්දෝරු සැලැස්මක් අනුමත කිරීම සඳහා ගාස්තු (නාගරික සංවර්ධන අධිකාරියේ ගැසට් නිවේදනය සහ නාගරික සංවර්ධන අධිකාරී පනත අනුව අයකෙරේ.) | |
| 05. | | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම්පත්‍රයක් සඳහා | 300 0 |
| 06. | 1. | තක්සේරු බදු ලේඛනයේ නම වෙනස් කිරීමේ ඉල්ලුම්පත්‍රයක් සඳහා | 200 0 |
| | 2. | එම ලියාපදිංචි කිරීමේ ගාස්තු | 300 0 |
| 07. | | අනතුරුදායක ගස් සම්බන්ධ ඉල්ලුම්පතක් සඳහා | 100 0 |
| ආදාහනාගාර ගාස්තු | | | |
| 08. | 1. | බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකු සඳහා | 7,000 0 |
| | 2. | බල ප්‍රදේශයෙන් පිටත අයෙකු සඳහා | 8,000 0 |
| 09. | | ඉඩම් කට්ටිකර අලෙවි කිරීමේ ගාස්තු විකුණුම් මිලෙන් 1%ක් | |
| 10. | | ජල ගාස්තු | |
| | 1. | ජල සම්බන්ධතා ගාස්තු රු. 12,500 (රු. 2,500ක තැන්පත් මුදල ද ඇතුළත්ව) | |
| | 2. | ජල ගාස්තු | |
| | | ස්ථාවර ගාස්තු රු. 100කි | |
| | | ඒකක 01 සිට 10 දක්වා එක් ඒකකයකට | 3 50 |
| | | ඒකක 11 සිට 20 දක්වා එක් ඒකකයකට | 7 50 |
| | | ඒකක 21 සිට 25 දක්වා එක් ඒකකයකට | 10 0 |
| | | ඒකක 26 සිට 30 දක්වා එක් ඒකකයකට | 15 0 |
| | | ඒකක 31 සිට 35 දක්වා එක් ඒකකයකට | 22 0 |
| | | ඒකක 35 වැඩි එක් ඒකකයට | 30 0 |
| | | මීට අමතරව විදුලි බිල අනුව ඉන්ධන ගැලපුම් ගාස්තුවක් අයකෙරේ. | |
| | 3. | ජල බවුසරය කුලී පදනම මත ලබාදීම (මීට අමතරව කි. මී. 1ක් සඳහා රු. 75ක් අයකෙරේ) | 3,000 0 |
| 11. | | ගලගෙදර සරත් අමුණුගම ක්‍රීඩාංගණය ක්‍රිකට් තරග සඳහා ලබාදීමේ ගාස්තු දිනකට (ක්‍රීඩාගාරය භාවිතා කරන්නේ නම් මීට අමතරව රු. 1,000ක් අයකෙරේ.) | 3,000 0 |
| 12. | | සරත් අමුණුගම සම්මන්ත්‍රණ ශාලාව කුලී පදනම මත ලබාදීම දිනකට | 5,000 0 |

01-435/8

**සංශෝධනයයි**

**වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාව**

**ව්‍යාපාර බදු අයකිරීම - 2016 වර්ෂය**

අංක 1938 - 2015 ඔක්තෝබර් මස 23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ 1526 පිටුවේ පළ කරන ලද වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාවට 2016 වර්ෂයට ව්‍යාපාර බදු අයකිරීම නිවේදනයේ බද්ද ගෙවිය යුතු කාලය 2016 වර්ෂයේ අප්‍රේල් මස 30 වශයෙන් සංශෝධනය කරන බව මෙයින් නිවේදනය කරමි.

පී. ඩබ්. ආර්. සී. පෙරේරා,
ලේකම්,
වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභාව.

2015 දෙසැම්බර් මස 16 වැනි දින,
අගලිය වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

01-284

---

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව**

**2016 වර්ෂයට අදාළව අයාලේ යන ගවයින් පිළිබඳ ගාස්තු පැනවීම**

මහ නගර සභා ආඥා පනතේ 252 අධිකාරය යටතේ 84 (1),(2),(3) හා (4) වගන්ති යටතේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, 2015 නොවැම්බර් මස 24 වැනි දින පවත්වනලද ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා රැස්වීමේ දී පහත උපලේඛනය පරිදි 2016 වර්ෂය සඳහා ගාස්තු අයකිරීම මෙයින් නිවේදනය කරමි.

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

*උපලේඛනය*

මහ නගර සභා සීමාව තුළ යම් වීදියක හෝ ඒ අවට බැඳ දිගේලි කර හෝ අයාලේ යමින් සිට අල්ලා ගනු ලබන ;

(අ) එක් ගවයෙකු සඳහා දඩ මුදල රු. 2,000
(ආ) නඩත්තු කිරීම හා රැක බලා ගැනීම වෙනුවෙන් දිනකට රු. 100
(ඇ) එසේ අල්ලා ගනු ලබන ගවයෙකු දින 10ක් ඇතුළත අයිතිකරු විසින් නිදහස් කරගනු නොලැබුවහොත් සභාව මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එම මුදල් මහ නගර සභා අරමුදලට යොදවනු ලැබේ.

01-330/1

---

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව**

**සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු - 2016 වර්ෂය**

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් 1938 අංක 26 දරන සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙකුටම හා බැල්ලියකටම රු. 10.00 ක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

01-330/2

**සංශෝධනයයි**

**පුත්තලම නගර සභාවේ 2016 වර්ෂය සඳහා අනෙකුත් ගාස්තු පැනවීම**

2015.12.04 දින අංක 1944 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ විවිධ දැන්වීම් යටතේ පළකරන ලද අංක 12-9/5 දරන නිවේදනය පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු ය.

එහි අනු අංක 25 යටතේ සඳහන්ව ඇති කොටස වෙනුවට "ලීටර් 3,000 ට්‍රැක්ටර් ජල බවුසරයක් නගර සභා බල ප්‍රදේශය තුළ ජලය සමග ප්‍රවාහනය කර දීමට රු. 1,500ක් ද, ලීටර් 6,000 ට්‍රක් ජල බවුසරයක් නගර සභා බල ප්‍රදේශය තුළ ජලය සමඟ ප්‍රවාහනය කර දීමට රු. 3,000ක්" ද විය යුතු බවත් දන්වා සිටිමි.

ඩබ්. ජී. නිශාන්ත කුමාර,
ලේකම්,
පුත්තලම නගර සභාව.

01-665/1

---

**සංශෝධනයයි**

**පුත්තලම නගර සභාවේ 2016 වර්ෂය සඳහා වරිපනම් ගාස්තු පැනවීම**

2015.12.04 දින අංක 1944 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ විවිධ දැන්වීම් යටතේ පළකරන ලද අංක 12-9/1 දරන නිවේදනය පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු ය.

එහි "යෝජනාවේ පළමු ඡේදයේ සඳහන් 2016 වර්ෂයට අදාළව ව්‍යාපාරික බදු ලෙස සඳහන් වී ඇති කොටස වරිපනම් බදු "ලෙස ද,

"එහි යෝජනාවේ දෙවන ඡේදයේ සඳහන් 2015 වර්ෂය සඳහා වූ තක්සේරුව 2016 වර්ෂය සඳහා වූ තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත් සඳහන්ව ඇති කොටස 2014 වර්ෂයේ වරිපනම් ප්‍රතිශෝධනය මත පදනම් වූ නව තක්සේරුව 2016 වර්ෂය සඳහා වූ තක්සේරුව ලෙස පිළිගැනීමටත්" ලෙස ද,

එහිම "වාර්ෂික වටිනාකමින් සියයට 80% ලෙස සඳහන් වී ඇති කොටස 08(%) ලෙස නිවැරදි විය යුතු බව ද දන්වා සිටිමි.

ඩබ්. ජී. නිශාන්ත කුමාර,
ලේකම්,
පුත්තලම නගර සභාව.

01-665/2

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.